සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I, II	කාලය / நேரம் / Time — පැය 3 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි **Additional reading time is -10 minutes**	අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න

1. පළමුවන පරම්පරාවේ පරිගණක හා සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

A	පරිපථ සඳහා ට්‍රාන්සිස්ටර් භාවිතා විය
B	පරිගණකයේ භෞතික ප්‍රමාණය සාපේක්ෂව විශාල විය
C	ක්‍රමලේඛණය සඳහා යන්ත්‍ර භාෂාව භාවිතා විය

නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) A පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) A, B සහ C යන සියල්ල ම

2. නිසිදු නව පරිගණකයක් මිල දී ගැනීමේ දී ඒ සඳහා රැහැන් රහිතව භාවිත කළ හැකි මූසිකයක් සහ යතුරු පුවරුවක් මිලදී ගැනීමට අදහස් කරයි. ඔහු එම උපාංග භාවිතයේ දී දත්ත සම්ප්‍රේෂණය වන මාධ්‍ය වනුයේ,

(1) වයිෆයි (Wi-Fi) (2) චන්ද්‍රිකා තාක්ෂණය (Satellite Technology)

(3) ක්ෂුද්‍ර තරංග (Microwave) (4) බ්ලූටූත් (Bluetooth)

3. සාමාන්‍යයෙන් පරිගණකයට ලබා දෙන උපදෙස් සැකසීම, සියලුම ගණනය කිරීම් සිදු කිරීම, තාර්කික විසඳුම් හා පද්ධතියේ දත්ත ගැලීම කළමනාකරණය කිරීම කරනු ලබන පරිගණකයේ ප්‍රධානම කොටස වන්නේ,

(1) දෘඩ තැටිය (2) සසම්භාවී පිවිසුම් මතකය

(3) මධ්‍ය සැකසුම් ඒකකය (4) පාලන ඒකකය

4. පරිගණක පද්ධතියකට UPS (නිර්බාධක බල සැපයුමක්) සවි කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ,

(1) පරිගණක පද්ධතියකට ඇතිවන බාහිර බලපෑම් වලින් ආරක්ෂා වීම.

(2) පරිගණක පද්ධති ඒකකය (System Unit) තුළ ඇති බැටරිය ආරෝපණය කිරීම.

(3) හදිසි විදුලි විසන්ධි වීමක දී තාවකාලිකව පරිගණකයට අවශ්‍ය බල සැපයුම ලබා දීම.

(4) විදුලිය නොමැති වූ විට දී වුව ද පරිගණක භාවිතයට පහසුකම් සැලසීම.

5. පහත දී ඇති ප්‍රකාශ සලකන්න

A	චුම්භක පටිවල ගබඩා කර ඇති ගොනු අනුක්‍රමික ප්‍රවේශ ආකාරයක් ගනී.
B	CD වල අනුක්‍රමික ප්‍රවේශ ගොනු ගබඩා කළ නොහැක.
C	DVD වල අනුක්‍රමික ප්‍රවේශ ගොනු හා සසම්භාවී ප්‍රවේශ ගොනු යන ගොනු ආකාර දෙකම ගබඩා කළ හැක.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) A හා C පමණි

6. ෂඩ් දශමය සංඛ්‍යාවක් වන 901_{16} නිරූපණයට අදාළ ද්විමය සංඛ්‍යාව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) 101100000010_2 (2) 101100000101_2 (3) 101000000001_2 (4) 100100000001_2

7. පහත දී ඇති 1 සහ 2 රූපවල ඇති සංඥාවලට අදාළව ප්‍රතිචාර දක්වන උපාංගය පිළිවෙළින් සඳහන් වන පිළිතුර කුමක් ද?



රූපය 1



රූපය 2

(1) උෂ්ණත්වමානය, ස්මාර්ට් ඔරලෝසුව (2) ස්මාර්ට් ජංගම දුරකථනය, නවීන වේගමාපක

(3) ටැබ් පරිගණකය, උකුල් පරිගණකය (4) ස්මාර්ට් ජංගම දුරකථනය, උෂ්ණත්වමානය

8. පහත සඳහන් කවර පිළිතුරක් මගින් 56_8 , 67_{16}, 00110111_2 , 110_{10} යන සංඛ්‍යාවල ආරෝහණ පටිපාටිය නිරූපණය වේද?

(1) 56_8, 00110111_2 , 67_{16}, 110_{10} (2) 67_{16}, 56_8, 110_{10}, 00110111_2

(3) 67_{16}, 110_{10}, 00110111_2, 56_8 (4) 00110111_2, 56_8, 67_{16}, 110_{10}

9. පහත සඳහන් BCD නිරූපණ සහිත ප්‍රකාශ සලකන්න.

A - BCD කේත ක්‍රමය මගින් ඕනෑම අනුලක්ෂණයක් නිරූපණය කරයි.


B - 01010011 ට වඩා 01110000 විශාල අගයක් ගනී.

C - 1000_{10} නිරූපණයට බිටු 16 ක් අවශ්‍ය වේ.

(1) A පමණක් නිවැරදි ය (2) B සහ C පමණක් නිවැරදි ය

(3) A සහ C පමණක් නිවැරදි ය (4) A, B සහ C යන ප්‍රකාශ තුනම නිවැරදි ය

10. පහත සඳහන් ගොනුවේ ධාරිතාවය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?



(1) ඉහත ගොනුවේ ධාරිතාවය මෙගා බයිට 8 (MB) කට ආසන්නව පවතී

(2) ඉහත ගොනුවේ ධාරිතාවය ගිගා බයිට 1 (GB) කට ආසන්නව පවතී

(3) ඉහත ගොනුවේ ධාරිතාවය බිටු 7624 x 1024 (Bits) කට ආසන්නව පවතී

(4) ඉහත ගොනුවේ ධාරිතාවය බයිට 7624 x 8 (Bytes) කට ආසන්නව පවතී

11. පහත දැක්වෙන බූලීය ප්‍රකාශන දෙක සලකන්න.


1 ප්‍රකාශය $\longrightarrow$ $A.\overline{B} + (A.B) = A\,(A+B)$ 2 ප්‍රකාශය $\longrightarrow$ $A.(B+C) + A.\overline{B} = A.C + A$

ඉහත ප්‍රකාශ සම්බන්ධව නිවැරදි පිළිතුර කුමක් ද? (ඉඟිය - සත්‍යතා වගු භාවිතා කරන්න)

(1) 1 ප්‍රකාශය නිවැරදි වන අතර 2 ප්‍රකාශය වැරදි වේ (2) 1 සහ 2 යන ප්‍රකාශ දෙකම වැරදි වේ

(3) 1 ප්‍රකාශය වැරදි වන අතර 2 ප්‍රකාශය නිවැරදි වේ (4) ප්‍රකාශ දෙකම නිවැරදි වේ

12. පහත දැක්වෙන තාර්කික ද්වාරය සලකන්න.



මෙහිදී Z හි ප්‍රතිදානය නියත වශයෙන්ම කුමක් විය හැකි ද?

(1) 1 වේ (2) 0 වේ

(3) A වේ (4) $\overline{A}$ වේ

13. එක්තරා තරගයකට මුහුණ දෙන තරගකරුවන්ට P, Q සහ R යනුවෙන් තනි තරග ඉසව් තුනක් ඇත. ඉන් කුමන හෝ එක් ඉසව්වක් තෝරා ගත හැකි අතර S නම් වූ තරග ඉසව්වට අනිවාර්යෙන්ම සහභාගී විය යුතුය.
ඉහත සිද්ධිය හා පහත කුමන බූලීය ප්‍රකාශනය ගැළපේ ද?

(1) S AND (P OR Q OR R) (2) S OR (P AND Q AND R)

(3) NOT S OR (P AND Q AND R) (4) S OR (NOT P OR NOT Q OT NOT R)

14. පරිගණක යතුරු පුවරුව සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකන්න.

A - යතුරු පුවරුවක Caps Lock යතුරු දෙකක් පවතින අතර shift යතුරු පවතින්නේ එකකි.


B - Backspace යතුර මගින් කර්සරයට (cursor) වම් පස ඇති අනු ලක්ෂණය ඉවත් කළ හැකි අතර delete යතුර මගින් කර්සරයට (cursor) දකුණු පස ඇති අනු ලක්ෂණය ඉවත් කරයි.


C - යතුරු පුවරුවක functions key දහයක් පවතින අතර ඒවා සුවිශේෂ වූ ක්‍රියා සඳහා පමණක් යොදා ගනියි.


ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,


(1) A පමණි (2) B පමණි (3) A හා C පමණි (4) A හා B පමණි


15. පහත සඳහන් තර්කන පරිපථය සලකන්න. එම පරිපථයේ සත්‍යතා වගුවට තුලිත සත්‍යතා වගුවක් සහිත තර්කන පරිපථය වන්නේ කුමක් ද?




(1)


(2)


(3)


(4)


16. මෙහි පෙන්වා ඇති තර්කන පරිපථය සලකා බලන්න.



A = 1 හා F = 0 නම් පහත සඳහන් කවරක් නිවැරදි ද?

(1) B = 0 සහ C = 0
(2) B = 1 සහ C = 1
(3) B = 0 සහ C = 1
(4) B = 1 සහ C = 0

17. පහත ප්‍රකාශ සලකන්න.

A - ලේඛනයට ප්‍රස්ථාරයක් ඇතුළු කිරීම
B - දෘඩාංග කළමනාකරණය
C - පරිශීලක අතුරු මුහුණත සපයා දීම

මෙහෙයුම් පද්ධතියක මූලික කාර්යයන් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) B පමණි
(2) B හා C පමණි
(3) C පමණි
(4) A, B සහ C යන සියල්ල ම

18. පරිශීලකයකු සහ පරිගණක පද්ධතියක් අතර අන්තර් ක්‍රියාකාරීත්වය දැක්වෙන පහත රූපසටහන සලකන්න.



මෙහි A සහ B සඳහා ගැළපෙන පද පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) යෙදුම් මෘදුකාංග සහ පද්ධති මෘදුකාංග
(2) පද්ධති මෘදුකාංග හා යෙදුම් මෘදුකාංග
(3) මෙහෙයුම් පද්ධතිය සහ යෙදුම් මෘදුකාංග
(4) භාෂා පරිවර්තක වැඩසටහන් සහ යෙදුම් මෘදුකාංග

19. මෙහෙයුම් පද්ධතියක් තුළ අන්තර්ගත උපයෝගීතා වැඩසටහන් හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.

A - පරිගණකයේ සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා පරිගණකය විවිධ උපද්‍රව වලින් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් බොහෝ උපයෝගීතා වැඩසටහන් අන්තර්ගත කර ඇත
B - පංගු බෙදීමට ලක්කර ඇති දෘඩ තැටියක් නැවත වරක් පංගු බෙදීමට ලක් කිරීමේ දී දැනට ඇති දත්ත මැකීයයි.
C - භාවිතා කරන ලද දෘඩ තැටියක් නැවත ආකෘතිකරණය කිරීමකට ලක් කළ නොහැකිය.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?

(1) සත්‍ය, අසත්‍ය, සත්‍ය
(2) සත්‍ය, සත්‍ය, අසත්‍ය
(3) අසත්‍ය, අසත්‍ය, සත්‍ය
(4) අසත්‍ය, සත්‍ය, අසත්‍ය

20. මෙහෙයුම් පද්ධති හා සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?

(1) චිත්‍රක පරිශීලක අතුරුමුහුණතක් සහිත මෙහෙයුම් පද්ධතියට වඩා විධාන පේළි අතුරුමුහුණතක් සහිත මෙහෙයුම් පද්ධතිය පරිශීලක මිත්‍රශීලී වේ.
(2) එකවර පරිශීලකයින් වැඩි පිරිසකට වැඩ කිරීමට පහසුකම් සපයන මෙහෙයුම් පද්ධති බහුකාර්ය මෙහෙයුම් පද්ධති වේ.
(3) පරිගණකයේ ස්ථාපිත සියලුම යෙදුම් මෘදුකාංග ක්‍රියාත්මක වන්නේ මෙහෙයුම් පද්ධතිය මත වේ.
(4) ගොනු තැන්පත් කිරීමට ගොනු බහාලුම් (Folders) භාවිතා කරන අතර එක් ගොනු බහාලුමක් (Folder) තුළ තවත් ගොනු බහාලුම් (Folders) සකස් කළ නොහැක.

21. වදන් සැකසුම් ලේඛනයක ඇති අකුරු හෝ වස්තුවක් පිටපත් කිරීමට .....(a)..... කෙටි මංයතුර භාවිතා කරන අතර එය ඇලවීමට ..... (b)..... කෙටි මංයතුර භාවිතා කරයි. a හා b ට ගැළපෙන පිළිතුර තිවැරදිව දැක්වෙන වරණය වන්නේ කුමක් ද?

(1) Ctrl+X, Ctrl+V (2) Ctrl+V, Ctrl+C (3) Ctrl+C, Ctrl+Ctrl+X (4) Ctrl+C, Ctrl+V

22. වදන් සැකසුම් මෘදුකාංග හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න. මින් සත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) වදන් සැකසුම් මෘදුකාංගයක අකුරු හැඩසවීම මගින් අකුරුවල ප්‍රමාණය, අකුරුවල හැඩය වෙනස් කිරීම මෙන්ම අකුරුවල වර්ණය වෙනස් කිරීම සහ ඡේද එකෙල්ල කිරීමද සිදු කළ හැකිය.

(2) වදන් සැකසුම් මෘදුකාංගයක ඡේද හැඩසවීම යටතේ ඡේද එකෙල්ල කිරීම මෙන්ම පේළි පරතරය වෙනස් කිරීම සහ අකුරු වර්ගය වෙනස් කිරීම සිදු කළ හැකිය.

(3) වදන් සැකසුම් ලේඛනයක ගොනු නම් දිගු ලෙස .docx, .doc, .odt භාවිතා කළ හැකිය.

(4) වදන් සැකසුම් මෘදුකාංගයක් තුළ පිටු සැකසුම යටතේ කඩදාසියේ ප්‍රමාණය අවශ්‍ය පරිදි වෙනස් කිරීමට හැකි වුවද පිටුවේ දිශානතිය වෙනස් කළ නොහැක.

23. වදන් සැකසුම් මෘදුකාංගයක දී ඡේදයක පේළි දෙකක් අතර දුර ප්‍රමාණය (Line Spacing) සකස් කිරීමට භාවිතා කරන මෙවලම තිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?


(1)


(2)


(3)


(4)

24. වදන් සැකසුම් මෘදුකාංගයක දී තැපැල් මුසුව භාවිතය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න. මින් සත්‍ය ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) මෙහිදී තැපැල් මුසුව භාවිතා කර නිර්මාණය කර තැන්පත් කරන ලද දත්ත භාවිතා කළ හැකි වුවද දත්ත සමුදාය මෘදුකාංගයක් තුළ තැන්පත් කර ඇති දත්ත භාවිතා කළ නොහැකිය.

(2) මෙහිදී ලේබල් මුද්‍රණය මෙන්ම තැපැල්පත් වල ලිපින මුද්‍රණය ද සිදු කළ හැකිය.

(3) මෙය වදන් සැකසුම් මෘදුකාගය තුළ මෙන්ම විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගය තුළ ද භාවිතා කළ හැකිය.

(4) මෙහිදී වෙන වෙනම ලේඛන සකස් කළ හැකි වුවද එය මුද්‍රණය කිරීමට අවස්ථාවක් නොමැත.

25. ගුණාත්මක ඉ - සමර්පණයක අඩංගු ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ කුමක් ද?

A - එක් කදාවක ඇතුළත් වාක්‍ය පේළි ප්‍රමාණය 9 ට වැඩිවිය යුතුය.

B - අකුරුවල ප්‍රමාණය පොයින්ට් 32 හෝ ඊට වඩා වැඩිවිය යුතුය.

C - පින්තූර, වගු සහ ප්‍රස්ථාර ඇතුලු කිරීමේ දී එක් කදාවක් සඳහා අවශ්‍ය පරිදි ඕනෑ තරම් ප්‍රමාණයක් ඇතුළත් කළ හැකිය.

(1) B පමණක් නිවැරදි ය (2) C පමණක් නිවැරදි ය

(3) A හා C පමණක් නිවැරදි ය (4) A, B සහ C යන සියල්ල ම නිවැරදි ය

26. විද්‍යුත් සමර්පණ මෘදුකාංගයේ දැකුම් තීරුව තුළ ඇති නිරූපක A තීරුවේ ද ඒවායේ ක්‍රියාකාරීත්වය අනුපිළිවෙලට නොමැතිව B තීරුවේ ද දැක්වේ. A සහ B තීරුවල නිවැරදි ගැළපුම වන්නේ,

A තීරුව		B තීරුව	
1		P	සමර්පණයේ ඇති සියලු කදා කුඩාවට පෙන්වයි. පහසුවෙන් අනුපිළිවෙල වෙනස් කළ හැකිය.
2		Q	තෝරා ගෙන ඇති කදාව සම්පූර්ණ තිරයේ දැක්වෙන අතර අන්තර්ගතය පහසුවෙන් කියවාගත හැකිය.
3		R	ඉ-සමර්පණය ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීම සඳහා මෙම දසුන භාවිතා කරයි.
4		S	සමර්පණය නිර්මාණය කරනු ලබන්නේ මෙම දසුනේ දී වන අතර අතුරුමුහුණතේ දී මෙම දසුන ලැබේ.

(1) 1 – Q, 2 – P, 3 – R, 4 – S (3) 1 –S , 2 – P, 3 – Q, 4 – R

(4) 1 – S, 2 – P, 3 – R, 4 – Q (4) 1 – P, 2 – Q, 3 – R, 4 – S

27. සකස් කරන ලද සමර්පණයක් මුල සිට නැරඹීම සඳහා භාවිතා කළ හැකි ක්‍රියාකාරී යතුර (Function Key) වන්නේ කුමක් ද?

(1) F1 (2) F2 (3) F4 (4) F5

28. පැතුරුම්පතක කෝෂයක =8+3*2^3/(8-4) යන සූත්‍රය ඇතුළත් කර ඇත. එමගින් ලැබෙන ප්‍රතිඵලය පහත පිළිතුරු අතරින් කුමක් විය හැකි ද?

(1) 22 (2) 11 (3) 14 (4) 7

29. ඉ-සමර්පණ මෘදුකාංග හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න. මින් සත්‍ය ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) එක් දෘෂ්‍ය රාමුවක සිට තවත් දෘෂ්‍ය රාමුවකට මාරුවීම විවිධාකාරයෙන් සැකසීම සඳහා සජීවීකරණ කවුළුව භාවිතා කරයි.

(2) කදාව තුළ අඩංගු වස්තූන්ට විවිධ චලනයන් ඇතුළත් කිරීම සඳහා සජීවීකරණ කවුළුව භාවිතා කරයි.

(3) කදා පිරිසැලසුම් භාවිතයෙන් පෙර සැකසූ කදා පිරිසැලසුම් පමණක් භාවිතා කළ හැකි අතර එම කදා අවශ්‍ය පරිදි වෙනස් කිරීමට අවස්ථාවක් නොමැත.

(4) ඉ-සමර්පණයේ දැනට ඇති කදා ගණන, තෝරාගෙන ඇති කදාවේ අංකය සහ තෝරාගෙන ඇති භාෂාව දසුන් තීරුවේ දිස්වේ.

30. පහත දැක්වෙන විද්‍යුත් පැතුරුම්පතෙහි D1 කෝෂය සඳහා ලබා දී ඇති =A$1*$A$1 සූත්‍රය E1 කෝෂයට සහ D2 කෝෂයට පිටපත් කළ විට එහි දැක්වෙන අගය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) 20, 12
(2) 20, 16
(3) 20, 9
(4) 16, 20

	A	B	C	D	E
1	4	5	6		
2	3	9	8		
3					

31. පහත දැක්වෙන පැතුරුම්පතේ C2 කෝෂය සඳහා A1, B1, C1 කෝෂවල අගයන්ගේ එකතුව ලබා ගැනීමට භාවිතා කළ **නොහැකි** සූත්‍රය වන්නේ කුමක් ද?

	A	B	C	D	E
1	10	13	8		

(1) SUM(A1+B1+C1) (2) = SUM(A1;B1,C1)
(3) = +SUM(A1+B1+C1) (4) = SUM(A1:C1)

32. පහත පැතැරුම්පත් වැඩපතේ D1 කෝෂය තුල = COUNT(A1:C1,B2) යන සූත්‍රය සඳහා ලැබිය හැකි පිළිතුර මින් කුමක් වේද?

(1) 3
(2) 4
(3) 5
(4) 6

	A	B	C	D
1	100	41/2	12-Oct	
2	ABC	Rs.150.00	15.3	
3				

33. පැතුරුම්පත් සම්බන්ධව පහත දක්වා ඇති ප්‍රකාශ සලකන්න. මින් **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) පැතුරුම්පත් කෝෂයක ලේබල් ඇතුළත් කිරීමේ දී පෙර නිමිති ලෙස වමට එකඑල්ල වේ.

(2) පැතුරුම්පතක CTRL+HOME යතුරු සංයෝජනය භාවිතයෙන් අදාළ පේළිය දිගේම A තීරුවට පහසුවෙන් කර්සරය (cursor) යොමුකළ හැකිය.

(3) පැතුරුම්පතක කාරක අඩංගු විට ප්‍රමුඛතා අනුපිළිවෙල වනුයේ (), ^ , *, + වේ.

(4) පැතුරුම්පතක Z තීරුවට පසු AA තීරුව ඇති අතර ZZ තීරුවට පසු AAA තීරුව ඇත.

ප්‍රශ්න අංක 34 සිට 37තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත වගු සැලකිල්ලට ගන්න.

Student_table

Index_no	Name	Age
S01	Nadun	12
S02	Ahinsa	13
S03	Ahamad	12

IOT_Devices_table

I_id	I_name	Count
001	Arduino Uno board	10
002	Bread Board	8
003	LED Bulb	45
004	PIR sensor	5
005	Altra sonic Sensor	10

Borrowing_Table

I_id	Index_no	Borrowing_Date
001	S01	2024/10/12
002	S03	2024/10/18
002	S03	2024/10/18
001	S01	2024/10/22
005	S02	2024/10/26


34. ඉහත වගුවලට අදාළ ප්‍රාථමික යතුරක් වන්නේ,
(1) I_ id (2) Name (3) I_name (4) Borrowing_Date

35. Student_table හා Borrowing_Table අතර පවතින සම්බන්ධතාවය කුමක් ද?
(1) එක-එක සම්බන්ධතාවය (2) එක-බහු සම්බන්ධතාවය
(3) බහු-බහු සම්බන්ධතාවය (4) සියල්ල නිවැරදියි

36. ඉහත වගුවලට අදාළ ආගන්තුක යතුරක් වන්නේ,
(1) Borrowing_Table - Borrowing_Date (2) IOT_Devices_table - I_id
(3) IOT_Devices_table - I_name (4) Borrowing_Table - Index_no

37. Borrowing_Table හි Borrowing_Date සඳහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූපය කුමක් ද?
(1) Date (2) Time (3) Date/Time (4) Date and Time

38. දත්ත සමුදාය මෘදුකාංග භාවිතයේ දී දැකිය හැකි මෙවලම් A තීරුවෙන් ද ඒවායේ නම් අනුපිළිවෙලින් තොරව B තීරුවෙන් ද දැක්වේ. එහි නිවැරදි ගැළපුම වන්නේ කුමක් ද?

A තීරුව		B තීරුව	
A		1	Data Sheet view
B		2	Primary Key
C		3	Reports
D		4	Design view

(1) A - 4, B - 1, C - 2, D - 3 (2) A - 1, B - 4, C - 2, D - 3
(3) A - 4, B - 1, C - 3, D - 2 (4) A - 1, B - 4, C - 3, D - 2

39. කර්මාන්ත හා ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතයේ හිතකර බලපෑමක් නොවන්නේ මින් කුමක් ද?
(1) පාරිභෝගිකයාට උසස් නිෂ්පාදන අඩු මුදලකට ලබා ගත හැකි වීම
(2) ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන නිපදවීමට හැකි වීම
(3) තාක්ෂණික මෙවලම් භාවිතය නිසා නිෂ්පාදන වියදම අඩු කර ගත හැකි වීම
(4) නව තාක්ෂණික උපාංග භාවිතය නිසා රැකියා අවස්ථා පුළුල් වීම

40. විදේශික සංචාරකයෙක් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වීසා පහසුකම ලබා ගැනීමට මාර්ගගත ක්‍රමය භාවිතා කිරීමට අදහස් කරයි. මෙම සිදුවීමට අදාළ ඉ-රාජ්‍ය සම්බන්ධතාව කුමක් ද?
(1) G 2 G (2) G 2 B
(3) G 2 C (4) G 2 E

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

- පළමුවන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.

1. (i) පුද්ගලයෙකු දුම්රිය ආසනයක් වෙන්කර ගැනීම සඳහා https://sheetresevation.railway.gov.lk යන වෙබ් අඩවියට පිවිස දිනය, ආරම්භක දුම්රිය පොළ, ගමනාන්ත දුම්රිය පොළ සහ මගීන් ගණන ඇතුළත් කළ විටදී අදාළ දුම්රිය, ගමන් ආරම්භක වේලාව, ගමන් අවසන් වේලාව සහ ටිකට්පත් සඳහා යන මුදල සංදර්ශනය කරයි. මෙම සිද්ධියට අදාළව ආදාන දෙකක් ප්‍රතිදාන දෙකක් සහ සැකසීමක් ලියා දක්වන්න.

(ii) පහත දැක්වෙන්නේ සුහුරු පන්නි කාමරයක දක්නට ලැබෙන උපාංග කිහිපයකි.
බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය (Multimedia projector), මුද්‍රණ යන්ත්‍රය (printer), tab පරිගණකය, ඩිජිටල් කැමරාව (Digital camera), VR headset, අන්තර් ක්‍රියාකාරී පුවරුව (Interactive board), ස්කෑනර් යන්ත්‍රය (scanner)
ඉහත උපාංග අතුරින්,
(a) ආදාන සහ ප්‍රතිදාන යන දෙකම සිදුවන උපාංග දෙකක් ලියා දක්වන්න.
(b) පරිශීලක අවශ්‍යතාවය අනුව දර්ශන තිරයේ ප්‍රමාණය වෙනස් කළ හැකි උපාංගය කුමක් ද?

(iii) නවීදු විසින් අන්තර්ජාලය භාවිතා කර තම පරිගණකයට ස්ථාපනය කර ගැනීම සඳහා 2560 KB ක ගොනුවක් බාගත (download) කරගන්නා ලදී. එම ධාරිතාවයට තුල්‍ය වන මෙගා බයිට් (MB) ප්‍රමාණය කොපමණ ද?

(iv) 503_8 යන අෂ්ටමය සංඛ්‍යාවට තුල්‍ය වන
(a) ද්වීමය සංඛ්‍යාව කුමක් ද?
(b) ෂඩ්දෂමය සංඛ්‍යාව කුමක් ද?

(v) ASCII වගුවේ G අක්ෂරය දශමය 71 න් ද m අක්ෂරය දශමය 109 න් ද නිරූපණය වේ නම්, Hi යන වචනයේ ඇස්කි කේතය ද්වීමය ආකාරයෙන් ලියන්න. (ගණනය කිරීම් පෙන්වන්න.)

(vi) පහත දැක්වෙන බූලීය ප්‍රකාශනය සඳහා අදාළ තාර්කික ද්වාරය ඇඳ දක්වන්න.

$$(\overline{X+Y}) \cdot (XY)$$

(vii) හිස්තැන් සඳහා ගැළපෙන පද පහත පද ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

පරිගණකයට විදුලිය ලබාදුන් සැනින් .....(1)..... මතකයේ ඇති .....(2)..... වැඩසටහන ක්‍රියාත්මක වේ. මධ්‍ය සැකසුම් ඒකකය වෙත යොමු කරන තෙක් දත්ත හා උපදෙස් රඳවා තබාගන්නේ .....(3)..... හි වන අතර එම මතකය .....(4)..... මතකය ලෙස හැඳින්විය හැකිය.

පද ලැයිස්තුව : {පඨන මාත්‍ර මතකය (ROM), සසම්භාවී ප්‍රවේශ මතකය (RAM), BIOS, නෂ්ය මතකය}

(viii) වර්තමානයේ අන්තර්ජාලයේ දියුණුවත් සමග වලාකුළු පරිගණකය ජනප්‍රිය මාතෘකාවක් බවට පත්වී ඇත. එමගින් සපයන එක් සේවාවක් නම්, මෘදුකාංග සේවාවක් ලෙස භාවිතය (SaaS) වේ. වලාකුළු පරිගණකයේ ඇති වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් පරිශීලකයාට ලබා ගත හැකි වාසි දෙකක් ලියා දක්වන්න.

(ix) පහත දැක්වෙන පැතුරුම්පත් කොටස භාවිතයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

	A	B	C	D
1	4	5	3	
2	-6	8	2	
3				

(a) ඉහත පැතුරුම්පත් කොටසට = SUM(A1:B2, C2) සූත්‍රය ඇතුළත් කළ විට ලැබෙන අගය කුමක් ද?

(b) A3 කෝෂයේ =A1*B1+$A2 ලියා ඇත්නම්, A3 හි දිස්වන අගය කුමක් ද?




(x) පහත දැක්වෙන දත්ත සමුදාය වගුව සලකන්න.

District	Type 1AB	Type 1C	Type 2	Type 3
Colombo	39	81	149	100
Gampaha	68	107	187	177
Kalutara	53	86	145	152

(a) ඉහත වගුවේ ක්ෂේත්‍ර ගණන හා රෙකෝඩ ගණන පිළිවෙලින් ලියා දක්වන්න.

(b) දත්ත සමුදායක දත්ත අනුපිටපත් වීමේ අවාසි දෙකක් ලියා දක්වන්න.

2. (i) මුද්‍රණ යන්ත්‍ර සම්බන්ධයෙන් පහත සඳහන් A සහ B තීරුවල සඳහන් උපාංග හඳුනා ගන්න.
A තීරුව B තීරුව හා ගළපා පිළිතුර ලේබල මගින් අක්ෂරය ⟶ අංකය ලෙස ලියා දක්වන්න.

A		1	
B		2	
C		3	


(ii) පහත සඳහන් පරිගණක කෙවෙනි හඳුනා ගන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

			
1	2	3	4

(a) ප්‍රතිදාන උපාංග සවිකළ හැකි කෙවෙනි හඳුනාගෙන ලේබල සමග එම කෙවෙනියේ නම ලියා දක්වන්න.

(b) ඉහත ලේබල 2 මගින් දැක්වෙන කෙවෙනියට සම්බන්ධ කළ හැකි උපාංගයක් ලියන්න.

(iii) පහත සඳහන් රූප සටහන පරිගණක ජාල හා සම්බන්ධ වේ.



(a) ඉහත රූප සටහනේ 1, 2, 3 හා 4 යන උපාංග සඳහා වඩාත් සුදුසු පදය වරහන් තුළින් තෝරා ලේබල මගින් ලියා දක්වන්න.
{අන්තර්ජාලය (Internet), සේවාලාභී පරිගණකය (Client Computer), ගිනි පවුර (Firewall), දත්ත සහ තොරතුරු ස්විචය (Switch) /නාභිය (Hub)}

(b) ඉහත රූප සටහනේ 1, 2, 3 හා 4 යන උපාංග සඳහා වඩාත් සුදුසු පදය වරහන් තුළින් තෝරා ලේබල මඟින් ලියා දක්වන්න.

(C) තොරතුරු සෙවීමේ ප්‍රධාන ක්‍රමවේදය වන අන්තර්ජාලය භාවිතා කිරීමේ දී පරිගණකයක් අන්තර්ජාලය හා සම්බන්ධ නොවීමට බලපෑ හැකි හේතු දෙකක් ලියා දක්වන්න.

3 (i) රෂිම් සිල්ලර වෙළෙඳ සැලකට ගොස් මිල රු. 730_8 ක බිස්කට් පැකට් එකක් සහ රු.$C8_{16}$ ක චොකලට් එකක් මිලට ගනී.

(a) මෙම භාණ්ඩ දෙක මිලදී ගැනීම සඳහා ඔහු ගෙවිය යුතු මුදල දශමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ගණනය කිරීම් අවශ්‍ය වේ.)

(b) එම මුදල ගෙවීම සඳහා රෂිම් රු 1000_{10} ක මුදලක් කඩ හිමියා වෙත ලබා දුන්නේ නම්, රෂිම්ට ලැබෙන ඉතිරි මුදල ද්වීමය ආකාරයෙන් පෙන්වන්න. (ගණනය කිරීම් අවශ්‍ය වේ.)

(ii) පහත සඳහන් ප්‍රකාශ හා ගැළපෙන වඩාත් සුදුසු පදය වරහන් තුළින් තෝරා ලේබලය - පදය ආකාරයෙන් ලියා දක්වන්න.

A - බහුලව භාවිත වන වැඩිම මතක ධාරිතාවයක් ඇති මතක උපාංගය


B - ධාරිතාවය වැඩිම සහ ප්‍රවේශ වේගය අඩුම මතක උපාංගය

C - පරිගණකයක නිතර භාවිත වන තාවකාලිකව දත්ත රඳවා තබා ගන්නා උපාංගය

D - ප්‍රකාශ මාධ්‍ය ගණයේ ආචනය උපක්‍රමයකි

පද ලැයිස්තුව: {බ්ලූ රේ තැටිය, දෘඩ තැටිය, චුම්භක පටිය, RAM, ROM}

(iii) පහත දැක්වෙන තාර්කික පරිපථය සළකන්න.



(a) ඉහත තාර්කික ද්වාරයෙහි Z හි ප්‍රතිදානය ලියා දක්වන්න.

(b) ඉහත Z මඟින් දැක්වෙන ප්‍රතිදානයට අදාළ සත්‍යතා වගුව ඇඳ දක්වන්න.

4 (i) මෙහෙයුම් පද්ධති හා සම්බන්ධ පහත දැක්වෙන වගන්තිවල සත්‍ය හෝ අසත්‍ය බව ලියා දක්වන්න.

(a) ගොනු තුළ තවත් ගොනු (file) සහ ෆෝල්ඩර (folders) අඩංගු විය හැකිය.

(b) ආදාන සහ ප්‍රතිදාන උපාංග පාලනය කිරීම මෙහෙයුම් පද්ධතියේ එක් කාර්යයක් වේ.

(c) මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයක් වනුයේ පරිගණකය මෙහෙයවීම සඳහා විධාන පේළි අතුරු මුහුණතක් (CLI) සැපයීම වේ.

(d) මෙහෙයුම් පද්ධතිය ආරක්ෂණ කළමනාකරණය යටතේ පරිශීලකයාට වෙන වෙනම ප්‍රවේශයන් සපයමින් පරිශීලක ගිණුම් කළමනාකරණයට පහසුකම් සපයයි.

(ii) උපයෝගීතා මෘදුකාංග හා සම්බන්ධ පහත වගුව සලකා බලන්න. එහි උපයෝගීතා වැඩසටහන් කිහිපයක් A තීරුවේ ද එහි ක්‍රියාකාරීත්වයන් අනුපිළිවෙලට නොමැතිව B තීරුවේ ද දක්වා ඇත. A හා B තීරු නිවැරදිව ගළපා 1→P ආකාරයට ලියා දක්වන්න.

A තීරුව		B තීරුව	
1	තැටි පංගු බෙදීම	P	ගොනු හා ෆෝල්ඩස් තැන්පත් කර හැකි ලෙස තැටි සැකසීම
2	තැටි ආකෘතීකරණය	Q	තැටිවල දෝෂ සහිත ප්‍රදේශ පරීක්ෂා කරයි
3	දත්ත සමමුහුර්ථකරණය	R	ප්‍රභව ආචයනය සහ ඉලක්කගත ආචයනය අතර සංගතතාවය පවත්වා ගනියි
4	තැටි සුපරීක්ෂණය	S	තනි ධාවකයක් තාර්කිකව කොටස් කිහිපයකට බෙදා වෙන් කරයි

(iii) පරිශීලක අතුරු මුහුණත සපයා දීම මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයකි. මෙහෙයුම් පද්ධතියක් මඟින් සපයන අතුරු මුහුණත් ආකාර දෙකකි. ඉන් එක් ආකාරයක් වන්නේ, ...(a)..... වන අතර අනෙක .....(b)..... වේ. .....(c)..... අතුරු මුහුණතේ ප්‍රධාන සංරචක .....(d)..... වන අතර .....(e)..... අතුරු මුහුණතේ ප්‍රධාන සංරචක .....(f)..... වේ.

හිස්තැන් සඳහා ගැළපෙන පද, පද ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

පද ලැයිස්තුව: { විධාන පේළි අතුරුමුහුණත (CLI), චිත්‍රක පරිශීලක අතුරුමුහුණත (GUI), ප්‍රේරකය (Prompt), නිරූපක (Icon), කවුලු (Windows), මෙනු (Menu), දක්වනය (Pointer) }

(vi) පද්ධති මෘදුකාංගවලට අයත්වන ප්‍රධාන වර්ග තුන නම්කර, එම එක් එක් වර්ගය සඳහා උදාහරණ එක බැගින් ලියා දක්වන්න.

(v) මෙහෙයුම් පද්ධතියක් මගින් ගොනු කළමනාකරණය යටතේ සපයනු ලබන සේවාවන් දෙකක් ලියා දක්වන්න.

5. වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සකස් කරන ලද කිසිදු හැඩසවීමකට (Formatting) ලක් නොකරන ලද ලේඛනයක් පහත රූපයේ දැක්වේ. මෙහි හැඩසවීමට ලක් කිරීමට අපේක්ෂිත කොටස් A සිට H දක්වා ලේබල් කර ඇත.


Operating System ← A

B

An operating system (OS) is a program that acts as an interface between the system hardware and the user. Mreover, it handles all the interactions between the software and the hardware. All the working of a computer system depends on the OS at the base level. Further, it performs all the functions like handling memory, processes, the interaction between **hardware and software**, etc. Now, let us look at the functions of operating system.

C

FIG 1.0



D

E

- **Convenience** – An operating system improves the use of a machine. Operating systems enable users to get started on the things they wish to complete quickly without having to cope with the stress of first configuring the system.
- **Efficiency** – An operating system enables the efficient use of resources. This is due to less time spent configuring the system.
- **Ability to evolve** – An operating system should be designed in such a way that it allows for the effective development, testing, and introduction of new features without interfering with service.
- **Management of system resources**[10] – It guarantees that resources are shared fairly among various processes and users.

F

Operating system - Wikipedia ← G

H → 1

1	2	3	4	5	6	7	8	9	10	11	12

(i) ඉහත ලේබල් වලින් දක්වා ඇති පාඨ සහ වස්තූන්ට අදාළ වෙනස්කම් සිදු කිරීමට පහතින් දැක්වෙන මෙවලම් තීරුවේ ඇති මෙවලම් භාවිතා කළ හැකිය. එම හැඩසවීමට අදාළ මෙවලමේ අංකය/අංක ලේබල සමග ලියා දක්වන්න.

(1) A මගින් දැක්වෙන මාතෘකාවේ අකුරු සඳහා හැඩතල (word art) ඇතුළු කිරීමට

(2) B මගින් දැක්වෙන වචනයේ A අකුර කැපිටල් කර විශාල කර ලබා ගැනීමට (Drop Cap)

(3) C මගින් දැක්වෙන වචනවලට යොදා ඇති හැඩසවීම් ඒ ආකාරයෙන්ම ඊළඟ පේළියට ද යෙදීමට

(4) D මගින් දැක්වෙන හැඩතලය ලබා ගැනීමට

(5) E මගින් දැක්වෙන Bullets ලැයිස්තුව ලබා ගැනීමට

(6) F මගින් දැක්වෙන ආකාරයට උඩු සලකුණක් ඇතුළු කිරීමට

(7) G මගින් දැක්වෙන ආකාරයට අධිසන්ධානයක් ඇතුළු කිරීමට

(8) H මගින් දැක්වෙන ආකාරයට පිටු අංක ඇතුළු කිරීමට

(ii) ඉ - සමර්පණයක් යන්න පැහැදිලි කර, ඉ - සමර්පණයක් තුළට ඇතුළු කර හැකි බහුමාධ්‍ය අංග හතරක් ලියා දක්වන්න

6 පහත දැක්වෙන්නේ 2019 සහ 2020 වර්ෂවලදී ලෝකයේ විවිධ රටවල් වලින් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ තොරතුරු ඇතුළත් පැතුරුම්පත් කොටසකි. එය උපයෝගී කරගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

	A	B	C	D	E	F
1		2019		2020		
2	**Country of Residence**	**Tourist Arrivals**	**Percentage**	**Tourist Arrivals**	**Percentage**	
3	India	355002	27.3	89357	29.8	-265645
4	United Kingdom	198776	15.3	55455	18.5	-143321
5	China	167863	12.9	26147	8.7	-141716
6	Germany	134899	10.4	34507	11.5	-100392
7	France	87623	6.7	24838	8.3	-62785
8	Australia	92674	7.1	20283	6.8	-72391
9	Russian Federation	86549	6.7	10435	3.5	-76114
10	United States	68832	5.3	16842	5.6	-51990
11	Maldives	60278	4.6	9436	3.1	-50842
12	Canada	48729	3.7	12436	4.1	-36293
13	**Total**	1301225		299736		

(i) 2019 වර්ෂයේ පැමිණි සංචාරකයින්ගේ මුළු එකතුව සෙවීම සඳහා B13 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය =FUNCTION(CELL1: CELL2) ආකාරයෙන් ලියා දක්වන්න.

(ii) 2019 වර්ෂයේ එක් එක් රටවල් වලින් පැමිණි සංඛ්‍යාව මුළු පැමිණීමේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම සඳහා (එක් එක් රටෙහි පැමිණීම / එම වර්ෂයේ මුළු පැමිණීම) *100 වේ. C3 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය කුමක් ද? (මෙම සූත්‍රය C3 සිට C12 දක්වා පිටපත් කළ යුතු බව සලකන්න.)

(iii) ඉහත C3 හි සඳහන් සූත්‍රය C3 සිට C12 දක්වා පිටපත් කළේ නම් C10 කෝෂයේ දැක්වෙන සූත්‍රය කුමක් ද?

(iv) 2020 වර්ෂයේ පැමිණි වැඩිම සංචාරකයින් ප්‍රමාණය සෙවීම සඳහා ලිවිය යුතු ශ්‍රිතය =FUNCTION(CELL1: CELL2) ආකාරයෙන් ලියා දක්වන්න.

(v) 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ පැමිණීමේ වෙනස දැක්වීම සඳහා F3 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය කුමක් ද?

(vi) 2019 සහ 2020 වර්ෂ දෙකෙහිම සංචාරකයින්ගේ පැමිණීම වඩාත් හොඳින් පෙන්වීම සඳහා සුදුසු ප්‍රස්ථාර වර්ගය කුමක් ද?

7 පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක තොරතුරු පිළිබඳව දත්ත ඇතුළත් සම්බන්ධිත දත්ත සමුදායක කොටසක් බව උපකල්පනය කරන්න.

Employee Table

Emp_ID	Name	Appointment Date	Department_Code
0509	Sunil Gunasekara	2020/10/12	001
0510	Pathum Fernando	2022/08/05	001
0511	Mihin Kulasooriya	2022/08/05	002
0512	Sithum Sandaras	2023/11/10	003

Department Table

Department Code	Department	No_of_ Employees
001	Management	12
002	Finance	8
003	Customer Handling	10

Salary Table

Emp_ID	Month	Salary
0510	2024/August	120000
0511	2024/August	133000
0511	2024/October	125000
0510	2024/October	128000

(i) ප්‍රාථමික යතුරක් හා සංයුක්ත ප්‍රාථමික යතුරක් ඒවාට අදාළ වගු නාම සමග ලියා දක්වන්න.

(ii) ආගන්තුක යතුරු දෙකක් ඒවාට අදාළ වගු නාමය සමග ලියා දක්වන්න.

(iii) එක් එක් සේවකයාගේ දුරකථන අංකය ඇතුළත් කිරීමට වඩාත් සුදුසු වගුව කුමක් ද?

(iv) 2024.11.11 වන දින Mohomad Suhail නම් නව සේවකයෙක් සේවයට එකතු වුයේ නම්, (Emp_ID 0513 , Department Finance) මේ සඳහා

(a) යාවත්කාලීන කළ යුතු වගුව/වගු මොනවා ද?

(b) යාවත්කාලීන කළ යුතු පේළිය/පේළි වගු නාමය →(ක්ෂේත්‍රය 1 , ක්ෂේත්‍රය 2 .....) ආකාරයෙන් ලියා දක්වන්න

(v) මෙම ව්‍යාපාර ආයතනය විසින් Advertising නමැති නවතම දෙපාර්තමේන්තුවක් සකස් කරන ලද අතර, Sunil Gunasekara නැමති සේවකයා එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී. මේ සඳහා

(a) යාවත්කාලීන කළ යුතු වගුව/වගු මොනවා ද?

(b) යාවත්කාලීන කළ යුතු පේළිය/පේළි වගු නාමය → (ක්ෂේත්‍රය 1 , ක්ෂේත්‍රය 2 .....) ආකාරයෙන් ලියා දක්වන්න

පොත් 3 ක් ගත්තොත්,



1 ක්



25%

දක්වා වට්ටම් හිමිකරගන්න.

නොමිලේ.

හොඳම පොත් අඩුම මිලට

අපෙන් විතරයි...

Atlas
Richard
RATHNA EXERCISE BOOKS

CASH ON DELIVERY | VISA | mastercard | KOKO

දැන්ම lol.lk වෙත පිවිසෙන්න

LOL.LK
LOL STORE (PVT) LTD

COD
CASH ON DELIVERY

037 20 60 110
071 77 74 440

10 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300



Rs : 300




Rs : 300



Rs : 300




Rs : 150



Rs : 150



Rs : 150




Rs : 150



Rs : 150




Rs : 200



Rs : 300



Rs : 350




Rs : 300




Rs : 300



Rs : 150




Rs : 200



Rs : 150



Rs : 300




Rs : 300




Rs : 300


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE